**ශීර්ෂය - 277 මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, එම මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

### 1.6.1.1 මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මඩුල්ල හා වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබුණු එකතුව රු.2,330,016 ක වටිනාකමක් වූ ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් 04 ක් ගොඩනැඟිලි සහ ඉදිකිරීම් යටතේ ගිණුම්ගත කළයුතු වුවද, එම වියදම්, මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් යටතේ ගිණුම් ගතකර තිබුණි. | 2021 වර්ෂයේ අයවැය මගින් මූලධන වත්කම් අත්පත්කර ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන් වී තිබුනේ ඉතා සීමිත ප්‍රමාණයකි. නමුත් වර්ෂය තුළ මෙම ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තු කර තිබූ බැවින් හා අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින් මූලධන වත්කම් වැඩි දියුණු කිරීම් වැය විෂයය යටතේ ගිණුම්ගත කර ඇත. මෙම ඉදිකිරීම් වල වටිනාකම දේපල පිරියත හා උපකරණ වටිනාකමට ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදි වැය විෂයයට ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයය යටතේ භාණ්ඩ 40 ක් මිලදී ගැනීමට රු.25,348,340 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද, එම භාණ්ඩ මිලදී ගැනුම් ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වැය විෂයයට ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.1.2 තැන්පතු ගෙවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත අනුව තැන්පතු ගෙවීම් රු.228,306,434 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.228,321,474 ක් ලෙස රු.15,040 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | භාණ්ඩාගාර සටහන් හා සසඳා නිවැරදි අගය ගිණුම්වල දැක්විය යුතුය. |

**1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

**1.6.2.1 මූල්‍ය නොවන වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් වල වටිනාකම රු.2,369,158,069 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු.2,370,876,603 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.1,718,534 ක වෙනසක් නිරීක්ෂණය විය. | තාක්ෂණික වශයෙන් පවතින දෝෂයක් බැවින් ශේෂයන් අතර වෙනසක් පවතී. අදාළ වෙනස්කම් පිළිබඳව භාණ්ඩාගාරය දැනුවත් කර ඇති අතර ඉදිරියේදී නිවැරදි කර ගැනීමට අදාළ කටයුතු සිදුකර ඇති බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂ නිවැරදිව ඉදිරිපත්කළ යුතු අතර, වෙනස්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වෙනත් යන්ත්‍ර හා උපකරණ වල ආරම්භක ශේෂ රු.4,619,567 ක් වුවද, ඊට අදාළව ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව වටිනාකම රු.7,175,383 ක් වූයෙන් රු.2,555,816 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය නො‍ාවන වත්කම් පිළිබද ප්‍රකාශනයේ වෙනසට, අදාළ වර්ෂයය තුළ ඇතුළත් කරන ලද රු.2,374,216 ක් හා රු.181,600 ක වටිනාකම හේතුවී ඇත. | වත්කම්වල නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2.2 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිය ගිය , වැඩ තහනම් කළ හා සේවය අතහැර ගිය සේවකයන්ගෙන් අය විය යුතු මුළු ණය ශේෂය රු. 1,863,855 ක් වූ අතර එම ශේෂය තුල වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් ඉක්මවූ ණය ශේෂ වටිනාකම රු.1,630,398 ක් විය. | අයකර ගැනීමට හා නිරවුල් කිරීමට කටයුතු කරමි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 66/69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කිරීමේදී සත්‍ය අවශ්‍යතාවය ගණනය කර ඒ අනුව මාරු කිරීම් සිදු කළ යුතු වුවද, එසේ කටයුතු නොකිරීම නිසා වැය විෂයන් 04 ක් සඳහා මාරු කර තිබුණු ප්‍රතිපාදනවලින් , සියයට 6 සිට සියයට 955 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණු බව නිරීක්ෂණය විය. | වැඩසටහන් අංක 02 යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රතිපාදන අවශ්‍යතාවයන් වෙන් වෙන් වශයෙන් සලකා මු.රෙ.66/69 යටතේ මාරු කිරීම් සිදු කර ඇත. 277 ශීර්ෂය සඳහා අයවැය මගින් වෙන් කරන ලද සමස්ථ ප්‍රතිපාදන සලකා මු.රෙ 66 අනුව මාරු කරන ලද වැය විෂයයන් වල වර්ෂ අවසානයේදී ඉතිරියක් පෙන්වුවද, වෙන්ව ගත් කළ දක්වා ඇති පරාසයන්ගේ ඉතිරිවීම් නොපෙන්වයි. | සත්‍ය අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව ප්‍රතිපාදන මාරු කළ යුතුය. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය** | | |
| (i) 2018 හා 2019 වර්ෂවල මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් යටතේ ග්‍රාම ශක්ති සමිති 125 ට ලබා දී තිබූ රු.79,771,475 ක් 2022 මාර්තු වන විටත් ඵලදායී කාර්යයකට නොයොදා නිෂ්කාර්යව පැවතුණි. | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ග්‍රාම ශක්ති ජනතා සමිති සමාගම් මැදුරේ ලියාපදිංචියෙන් ඉවත් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ලියාපදිංචි කරන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | වෙන් කර ඇති මුදල් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) පළමු අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී, | මෙම ග්‍රාම ශක්ති ජනතා සමිති, ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ලියාපදිංචි කිරීමෙන් පසු මෙම මුදල් නැවත උපයෝජනය පිළිබඳ | හිඟ ණය මුදල් අප්‍රමාදව අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2019 වර්ෂයේදී චක්‍රීය ණය ක්‍රමය යටතේ ලබා දුන් ණය මුදල් වලින් රු.5,857,934 ක් හා පොළිය රු.516,662 ක් හිඟව පැවතුණි. | අමාත්‍යාංශයේ උපදෙස් මත කටයුතු කරන බව සදහන් කරමි. | |
| (iii) | පළමු අදියර යටතේ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 03 ක තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් සඳහා සියයට 50 ක ප්‍රතිලාභී දායකත්වය යටතේ 2019 වර්ෂයේ ලබාදී තිබුණු ණය මුදල් වලින් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.375,000 ක ණය සහ රු.52,688 ක පොළිය හිඟව පැවතුණි. | දිසාපති සමුළුවලදීද මෙම ගැටළුව පිළිබද සාකච්ඡා කළද මෙතෙක් නිශ්චිත උපදෙසක් අමාත්‍යාංශයෙන් නොලැබීම හේතුවෙන් චක්‍රීය අරමුදල් ක්‍රමය නිසි ලෙස ක්‍රියාත්මක නොවේ. | ණය මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

(ආ) **ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ චක්‍රීය ණය වැඩසටහන**

---------------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2009 සිට 2020 දක්වා ප්‍රතිලාභීන් 109 කට ලබා දී තිබූ ණය මුදල් වලින් රු.1,298,351 ක ණය සමාලෝචිත වර්ෂයය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | ණය ලාභීන් වාරික වශයෙන් ගෙවමින් පවතී. | හිඟ ණය මුදල් අප්‍රමාදව අය කර ගත යුතුය. |
| (ii) | මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේදී ලබාදී තිබුණු ණය මුදලින් ණයලාභීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.53,300 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු ණය මුදලින් රු.13,850 ක් අයකරගෙන ඇත. තවදුරටත් අයවිය යුතු ණය මුදල ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | -එම- |
| (iii) | තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, 2009 සිට 2016 කාලය තුල විවිධ වැඩ සටහන් යටතේ ණය ලාභීන් 56 කට ලබාදී තිබුණු ණය මුදලින් රු.737,410 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයය අවසාන වන විටත් හිඟව පැවතුණි. | අයනොවී පවතින ණය ශේෂ නැවත අයකර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් ඉල්ලා ඇත. එම උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදුකරමි. | -එම- |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1971 අංක 03 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස සන්තකය ආපසු ගැනීමේ පනත | 106,000 | ගිවිසුම්ගත කාලය අවසන් වුවද, නැවත භාර නොදුන් රජයේ නිවාස 06 ක් යොමුගත පනතේ රෙගුලාසි ප්‍රකාරව නැවත පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිවාස නැවත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | පනතේ විධිවිධාන ප්‍රකාරව රජයේ නිවාස නැවත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත හා පරිසර හා වනජීවී අමාත්‍යාංශයේ අංක 01/2020 හා 2020 ජනවාරි 03 දිනැති පරිසර චක්‍රලේඛයයේ 28 හා 44 වගන්ති | 71,563 | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් වලංගු කැණීම් බලපත්‍රයක් ලබා නොගෙන තණමල්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක කර තිබුණු සංවර්ධන ව්‍යාපෘති 26 ක් සඳහා පස්/බොරළු කැපීම ස්ථාන 10 කින් සිදුකර තිබුණි. තවද, ඊට අදාළව රජයට අය විය යුතු රාජ්‍ය භාග ආදායම අහිමි වී තිබුණි. | ඉදිරි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, පස් / බොරළු ලබා ගැනීමේදී බලපත්‍ර සහිත ස්ථාන වලින් පමණක් ලබා ගැනීමට කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව දන්වමි. රාජ්‍ය භාග අදායම වන රු.71,563 ක මුදල අදාළ ගිවිසුම් ගත සමිති වලින් අයකර ගෙන රජයට ගෙවීමට කටයුතු කරමි.ව්‍යාපෘති 08 ක් සඳහා වන රු.18,542 ක මුදලක් අයකර ගෙන රාජ්‍ය ආදායමට බැරකරන ලදී. | පනතේ හා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පස් හෝ බොරළු කැණීමක් සිදු කරන විට වලංගු බලපත්‍රයක් ලබාගත යුතු අතර රාජ්‍ය භාගය අයකර ගැනීමටද, කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.2 වගන්තිය | | රජයේ නිවාසයක් රජයේ නිලධාරියකුට පමණක් වෙන්කර දියහැකි වුවද, ඊට පටහැනිව යමින් වරිපනම් අංක 28/49 දරන රජයේ නිවාසය 2017 සැප්තැම්බර් 25 දින සිට වසර 04 කට වැඩි කාලයක් මාසිකව රු.3,000 ක කුලියකට තාවකාලික පදිංචිය සඳහා පුද්ගලික ආයතනයක සේවය කරන ඉංජිනේරුවරයෙකුගේ පරිහරණය සඳහා ලබා දී තිබුණි. | නව නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සිදුවන විට මෙම නිවසේ රජයේ නිලධාරින්ට පදිංචි වීමට අපහසු බව වාර්තා වී ඇති බැවින් රු.3,000 ක මාසික කුලියකට සී.ටී.එස්.එල් ආයතනය වෙත ලබා දී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව රජයේ නිලධාරියකුට පමණක් රජයේ නිවාස වෙන්කරදීමට කටයුතු කළ යුතුය. අයකර යුතු අතර ඊට අදාළ කුලියද, ආයතන සංග්‍රහය අනුව අයකළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------- | | | | |
| | (i)මුදල් රෙගුලාසි 104 (4) | | අලාභහානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද, වසර 1–5 ත් අතර කාලය ඉක්මවා තිබුණු වාහන අනතුරු 4 ක් සම්බන්ධව ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදුකරමින් පවති. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | (ii)මුදල් රෙගුලාසි 237 (අ) (i) හා (ආ) | 12,864,759 | ඇණවුම් කරන ලද සැපයුම් හා සේවා ලබා දී නොතිබියදී සහ ඒ සම්බන්ධව ක්‍රියාත්මකව පවතින අභ්‍යන්තර පාලන ක්‍රමවේදයට මුළුමනින්ම පටහැනිව යමින් මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2021 දෙසැම්බර් 31 දින සැපයුම්කරුවන්ට චෙක්පත් 19 ක් ලියා තිබූ නමුදු 2022 මාර්තු 29 දින වන විටත් එම චෙක්පත් අතරඳවාගෙන තිබුණි. | චෙක්පත් 05 ක් 2022 මැයි 26 දින වන විට නිකුත් කර ඇති අතර අනෙකුත් චෙක්පත් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු සිදුකරමින් පවති. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු අතර ඊට සම්බන්ධ පාර්ශව වලට විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii)මුදල් රෙගුලාසි 571(3) | 6,295,355 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 07 කට අදාළ, වර්ෂ 02 ක කාලය ඉක්මවූ තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු සහ කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු.2,862,219 ක් විගණන විමසුම් පවතින බැවින් හා රු.61,862 ක් කර්මාන්තයේ අඩුපාඩු පවතින බැවින් නොගෙවා රඳවා තබාගෙන ඇත. රු.630,202 ක් රාජ්‍ය ආදායමට බැරකර ඇති අතර රු.1,224,800 ක් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ඉ) **2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** ------------------ | | | | |
| (i) 5.4.8 (අ) වගන්තිය | | නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ හැබැස්ස පුරාවිද්‍යා ස්ථානය සඳහා වන පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2019 සැප්තැම්බර් 18 දින කොන්ත්‍රාත්කරුවකු සමඟ රු.2,389,340 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණු අතර, කොන්ත්‍රාත්කරු කාර්යය සිදුකර නොතිබුණු අතර කාර්යය සාධන ඇපකරය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. නමුත් ව්‍යාපෘතිය වෙනත් ක්‍රම වේදයක් ඔස්සේ අවසන් කිරීමට කටයුතුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්ති අනුව කාර්යය සාධන ඇපකරය රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 8.9.1 (ආ) වගන්තිය | 9,176,057 | රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, | පිළිගනිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්ලාස්ටික් පුටු 4695 ක්, ජල බවුසර් 05 ක් හා ටැබ් යන්ත්‍ර 18 ක් මිලට ගැනීමේදී, එවැනි ගිවිසුමකට එළඹී නොතිබුණි. | | |
| (ඊ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 3.3 වගන්තිය | • තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෝදාගම ග්‍රාම නිලධාරී වසමේ අක්කර 1/2 ක් පමණ වූ රජයේ ඉඩමක 2021 වර්ෂයේ අනවසරකරුවකු විසින් කඩකාමර කිහිපයක් ඉදි කිරීම සඳහා කොන්ක්‍රීට් කණු 64 ක් පමණ ඉදිකර තිබුණු අතර කාල ප්‍රමාදයකින් පසු ග්‍රාම නිලධාරී විසින් 2021 ජුනි 07 දින එම අනවසර ඉදිකිරීමේ කටයුතු පිළිබඳ වාර්තා කර තිබුණි. එසේම එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට 2021 දෙසැම්බර් 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අදාළ අනවසරකරුට විරුද්ධව වැල්ලවාය ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ නඩු පවරා ඇත. | චක්‍රලේඛයේ 3.3 වගන්තිය ප්‍රකාරව දෙසති වාර්තා කඩිනමින් ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | | • තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පහළ හොබරගොඩ වැව යටතේ 2020 වර්ෂයේ නව ඉඩම් බෙදාදීමේ ඉඩම් කච්චේරියේ ප්‍රතිලාභීන් 18 දෙනෙකුට බෙදාදීමට යෝජිත කුඹුරු ඉඩම් කට්ටි 18 හි 2013 වර්ෂයේ සිට අනවසරකරුවෙකු වගා කටයුතු සිදුකරන | අනවසරයෙන් භුක්ති විඳින අක්කර 03 ක ප්‍රදේශය නිවැරදිව හඳුනා ගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. පිඹුරුපත ලද පසු අදාළ ඉදිරි කටයුතු සිදුකරමි. | චක්‍රලේඛයේ 3.3 වගන්තිය ප්‍රකාරව දෙසති වාර්තා කඩිනමින් ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | බැවින්, ප්‍රතිලාභීන්ට එම බලපත්‍ර බෙදා දීම තාවකාලිකව නවතා තිබුණු අතර එම අනවසරකරු ඉඩමෙන් නෙරපීමට 2021 දෙසැම්බර් මස වන විටත් කිසිදු විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (උ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය | යොමුගත චක්‍රලේඛය නිකුත් කර මාස 3 ක් ඇතුළත අපහරණය කළ යුතු වාහන අපහරණය කර අවසන් කිරීමට සියළු ගණන් දීමේ නිලධාරින්ගේ වගකීම වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සුන්බුන් ලෙස පවතින වාහන 9 ක් 2022 පෙබරවාරි 24 දින වන විටත් අපහරණය කර නොතිබුණි. | ඉදිරියේදී අපහරණ කටයුතු සිදුකරමි. | චක්‍රලේඛ උපදෙස් හා අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වාහන සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සපිරිගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020** | | |
| | i. මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඉගිනියාගල ග්‍රාම නිලධාරී වසමේ කර්මාන්ත පුහුණු කිරීමේ හා නිෂ්පාදන අලෙවි කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් 2021 වර්ෂයේදී රු.1,969,508 ක වියදමක් දරා තිබුණි. ඉදිකිරීම් කටයුතු නිම කර වසරක කාලයක් ගත වීමට පෙර මෙම | පිළිගනිමි. නිවැරදි අකාරයට ගෙබිම සකස් කළ පසු අතරැදවුම් මුදල් නිදහස් කරමි. විදුලිය නොමැතිකම හේතුවෙන් අරමුණ ගත කාර්යයන් සඳහා යොදාගෙන නැත. | අරමුදල් ඵලදායිව ප්‍රයෝජනයට ගත යුතු අතර, ව්‍යාපෘති තුලින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ලේ ගෙබිම මීටර් 9.16 ක් පමණ දිගට ඉරිතැලී ගොස් ඇති බව 2022 ජනවාරි 28 දින සිදු කල ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම කර්මාන්ත පුහුණු කිරීමේ හා නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානය අරමුණුගත කාර්ය සඳහා යොදා ගෙන නොතිබුණි. | | |
| ii. තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මහ වැව වසමේ පෙරපාසල් ගොඩනැගිල්ලක් රු.1,980,000ක් වැය කර ඉදිකර වර්ෂයකට අධික කාලයක් ගත වී තිබුණද, එය අරමුණුගත අදාළ කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි. | ජලය, විදුලිය හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගත් පසු පෙරපාසල පැවැත්වීම සඳහා යොදාගැනීමට නියමිතව ඇත. | යෙදවූ මුදල් වලින් ඵලදායිව ප්‍රයෝජන ගත යුතු අතර, අපේක්ෂිත අරමුණු කරා ළඟා විය යුතුය. |

## 3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------------- | ------------------------------ | ------------- |
| (අ) | නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් හැබැස්ස පුරාවිද්‍යා ස්ථානය සඳහා වන පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2019 ජුනි 19 දින රු.3,594,053 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. කර්මාන්තය සඳහා තෝරාගත් පළමු හා දෙවන කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපෘතිය ඉටු නොකිරීම හේතුවෙන් බුත්තල ප්‍රාදේශීය සභාවේ ඉල්ලීමකට අනුව මෙම ව්‍යාපෘතිය සෘජු ශ්‍රම පදනම මත ඉටු කිරීමට 2020 ජනවාරි 21 දින බුත්තල ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණි.<br><br>ප්‍රාදේශීය සභාව සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණු අතර, ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතු දිනයක්ද තීරණය කර නොතිබුණි. ව්‍යාපෘතියේ කටයුතු නිම නොකිරීම හේතුවෙන් 2022 මාර්තු 23 දින වන විටත් මෙම ව්‍යාපෘතිය සඳහා ලද ප්‍රතිපාදන මුදලින් රු.864,065 ක් වසර 02 කට අධික කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඇතිබව නිරීක්ෂණය විය. | අතපසුවීමකින් ගිවිසුම්ගත වී නොමැති බව පිළිගනිමි. මේ වන විට ඉදිකිරීම් අවසන් කර ගෙවීම සඳහා බිල් පත් ඉදිරිපත් කර ඇත. | නියමිත කාල පරිච්ඡේදය තුල ඵලදායි ලෙස ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් විදුලි වැට නඩත්තුව හා පසු විපරම් ක්‍රියාවලියට අදාළව විදුලි වැට ආශ්‍රිතව මුරකුටි ඉදිකිරීම් සඳහා 2020 මාර්තු මස 08 දින රු.36,451,618 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර, ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා පැකේජ 05 කට වෙන් කර තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු සමඟ පැකේජ අංක 1/2/3 සහ 5 යටතේ රු.25,009,958 කට ගිවිසුම්ගතව තිබුණි. 2022 මාර්තු 22 දින වන විටත් මෙම ඉදිකිරීම් කටයුතු නිමකිරීම හෝ ව්‍යාපෘතියේ ගිවිසුම් ගත කාලය දීර්ඝ කිරීම් කර නොතිබුණි. | මෙම කර්මාන්තයට අදාළව අතරුදවූම් මුදලද ඇතුළු සියළු ගෙවීම් මේ වන විට ගෙවා ඇති බව දන්වන අතර තැන්පතු ගිණුමෙහි ඉතිරිව පවතින එම රු.33,572 ක මුදල රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. | ඇස්තමේන්තු වැඩ කොටස් ගිවිසුම්ගත කාලය තුළ නිම කළ යුතුය. |

**3.3 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ විජයපුර කනිටු විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම** | | |
| | **i.** ක්‍රීඩා පිටියේ පස් මීටර් කියුබ් 1821 ක් කපා තුනී කර ජලය යොදා තැලීම සිදු කළ බවට ගෙවීම් වාර්තාවේ දක්වා තිබුණද, ක්‍රීඩා පිටියෙන් කපා ගත් පස් වලින් මීටර් කියුබ් 677.06 ක් තුනී කර ජලය යොදා තැලීමේ කාර්යය සිදු කර නොතිබියදී ඒ සඳහා රු.254,100 ක් ගෙවා තිබුණි. | ඉතිරිව ඇත්තේ මතුපිට තණකොළ සහිත ඉවත් කළ පස් කොටසයි. එබැවින් මෙහි වැඩිපුර ගෙවීමක් සිදුවී නොමැත. | නිවැරදිව මිණුම් ලබාගෙන ගෙවීම් වාර්තා සකස් කර ගෙවීම් කළ යුතුය. |
| | **ii.** ඉදිකර තිබුණු කාණුව ආරම්භයේ මීටර් 9.5 ක් වූ දිග සහිත කොටසක් ගැඹුර මීටර් 0.250 ක් වුවද, බිල්පත් සකස් කිරීමේදී, කාණුවේ ගැඹුර මීටර් 0.450 ක් ලෙස දක්වා මිනුම් සකස් කිරීම හේතුවෙන් රු.25,293 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීමක් සිදුවී නොමැත. | -එම- |

| | | | |
|---|---|---|---|
| **iii.** | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.2 ඡේදය අනුව මාස තුනක කාලපරිච්ඡේදයක් ඉක්මවන වැඩ සඳහා වූ යම් කොන්ත්‍රාත්තුවකදී මිල විචලනයන් සඳහා වෙන් කිරීම් කර ගෙවීම් කිරීමට හැකියාව ඇති නමුත්, ගිවිසුම් කාලය දින 60 ක් වූ මෙම කර්මාන්තයේ මිල විචලනයන් සඳහා ගෙවා තිබූ රු.172,353 ක මුදල වැඩිපුර ගෙවීමක් ලෙස නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල උච්ඡාවචනයට ලක්වීම නිසා ඌව පළාත් සභාව මගින් 05/2021 චක්‍රලේඛය නිකුත්කර ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පළාත් සභාව මගින් නිකුත් කරන ලබන රේටයන් භාවිතා කරන බැවින් එම චක්‍රලේඛය අනුව ඇස්තමේන්තුව සඳහා මිල විචලනය ඇතුලත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.2 වගන්තිය ප්‍රකාරව මිල විචලනයන් වෙනුවෙන් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් නිල නිවාසය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.2,468,941 ක වියදමක් දරා තිබුණි. වාහන අංගනයේ ගෙබිම කොන්ක්‍රීට් අතුරා සුද මැදීම වෙනුවෙන් ව.මී. 28.47 ක් සඳහා රු.55,630 ක් ගෙවීම් කර තිබුණද, සුද මැදීම සිදු කළ ප්‍රමාණය ව.මී. 19.89 ක් බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා රු. 16,765 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. | ඉටු කර ඇති කාර්යයන් සඳහා පමණක් ගෙවීම් කළ යුතු අතර, වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. |
| (ඇ) | මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරලිය සංවර්ධන වැඩසටහන 2019 යටතේ තිඹිරිය ක්‍රිඩා පිටිය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.970,000 ක වියදමක් දරා තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ මීටර් 32.5 ක් දිගින් යුතු පැති බැම්මක් ඉදිකිරීම සඳහා අත්තිවාරම් කැපීම ජේ.සී.බී යන්ත්‍රයක් මගින් සිදු කර තිබූ නමුදු එම කාර්යය ඇස්තමේන්තු කිරීමේදී, රජයට අවම පිරිවැයක් දරන පරිදි යන්ත්‍ර භාවිතා කර කාණු කපන පරිදි ඇස්තමේන්තු සකස් කර නොතිබීමෙන් හා ගෙවීම් කිරීම සඳහා හස්ත රේටයක් භාවිතා කිරීම නිසා රු.35,152 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවීමක් කර ඇති බව පෙන්වා දී ඇතත් "704" ආකෘති පත්‍රය සැලකිල්ලට ගැනීම තුලින් ව්‍යාපෘතිය ප්‍රතිපාදන සීමාව ඉක්මවා වැඩ කර ඇති බව පෙනීයයි. | රජයට වාසිදායක රේටයන් යොදාගෙන ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

**(ඇ) තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සපිරිගමක් ජනතා සහභාගීත්ව සංවර්ධන වැඩසටහන - 2020**

-----------------------------------------

| | | | |
|---|---|---|---|
| i. | වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබුණු මාර්ග සංවර්ධන ව්‍යාපෘති 03 ක් සඳහා පස්/බොරළු මීටර් කියුබ් 958 ක්, පෞද්ගලික ආයතනයක් පවත්වාගෙන යන රජයේ ඉඩමකින් ගෙවීමක් සිදු නොකර ලබාගෙන තිබුණු අතර, ඒ සඳහා කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු රු.609,288 ක මුදල වැඩිපුර ගෙවීමක් බව නිරීක්ෂණය විය. එමෙන්ම, සංවර්ධන ව්‍යාපෘති දෙකකට අදාළව පස් ගොනු කිරීමේ කාර්යය ඉටුකර නොතිබියදී, ගෙනෙන ලද පස් ගොනුකළ බවට දක්වමින් පස් මීටර් කියුබ් 808 ක් සඳහා රු.127,300 ක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | වැඩිපුර ගෙවීම් නැවත අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු අතර ඇස්තමේන්තු සකස් කිරීමේදී, අනුමත බොරළු සපයන ස්ථාන හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතුවේ. |
| ii. | බෝදාගම අතුරු මාර්ගයෙහි බෝක්කු ඉදිකර ග්‍රැවල් දමා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.1,980,000 ක වියදමක් දරා තිබුණි. මාර්ගය සඳහා අනුමත පස්/බොරළු යෙදීම වෙනුවෙන් පස් මීටර් කියුබ් 436 ක් සඳහා රු.523,898 ක් ගෙවා තිබුණු අතර, එම ග්‍රැවල් පස්, සංවර්ධනය කරන ලද මාර්ගයේ පසෙක පිහිටි පෞද්ගලික ඉඩමකින් සපයා ගෙන එම ඉඩම් හිමියා වෙත රු.33,000 ක මුදලක් පමණක් ගෙවා තිබීමෙන්, පස් සඳහා ගෙවා තිබුණු රු.244,296 ක මුදල වැඩිපුර ගෙවීමක් ලෙස නිරීක්ෂණය විය. | වැඩිපුර ගෙවීම් නැවත අයකර ගැනීමට කටයුතු කරන බවට දන්වමි. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු අතර ඇස්තමේන්තු සකස් කිරීමේදී, අනුමත ග්‍රැවල් සපයන ස්ථාන හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතුවේ. |
| iii. | උස්ගල රණවිරු මාවතේ කෝසුව ඉදිකිරීම සඳහා රු.493,372 ක වියදමක් දරා තිබුණි. මාර්ගය මීටර් 66.5 ක් දිගට සහ මීටර් 2.5 ක් පළලට කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කර තිබුණු අතර ඉන් ස්ථාන 04 ක කොන්ක්‍රීට් කරන ලද මාර්ගය මැදින් මීටර් 10, මීටර් 8.3, මීටර් 09 ක් සහ මීටර් 3.5 ක් (එකතුව මීටර් 30.8 ක්) දිගින් යුතු ඉරි තැලීම්ද, මාර්ගයේ | පෙන්වා දී ඇති අඩුපාඩු නැවත සකස් කරවා ගැනීමට කටයුතු කරමි. | ඇස්තමේන්තුව අනුව නියමිත ප්‍රමිතියෙන් යුතුව ඉදිකිරීම් කටයුතු සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ස්ථාන දෙකක වර්ග මීටර් 1.82 ක ප්‍රමාණයක් ගිලා බැසීමද සිදුව ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ඉ) | මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ඌන සංවර්ධිත විහාරස්ථාන වැඩිදියුණු කිරීමේ වැඩසටහන 2021 යටතේ බෝධිමළු විහාරයේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින රු.340,000 ක වියදමක් දරා තිබුණි. වටපිලෙහි කොන්ක්‍රීට් යෙදීම හා සුද මැදීම සඳහා රු.39,381 ක් ගෙවීම් කර තිබුණද, සුද මැදීම සිදුකර නොතිබුණු බැවින් ඒ සඳහා ගෙවන ලද රු.14,884 වැඩිපුර ගෙවීමක් බව නිරීක්ෂණය විය. | වැඩිපුර ගෙවන ලද රු.14,184 ක මුදල අතරුදවුම් මුදල් නිදහස් කිරීමේදී, අයකරගන්නා බව දන්වා සිටිමි. | ඇස්තමේන්තු ගත කාර්යයන් ඉටු කර ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් කළ යුතුය. |
| (ඊ) | මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන 2021 යටතේ, මාරිඅරාව වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව රු.38,190 ක ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි. | වැඩිපුර ගෙවන ලද රු.38,190 ක ප්‍රමාද ගාස්තු මුදල අතරුදවුම් මුදල් නිදහස් කිරීමේදී, අයකරගන්නා බව දන්වා සිටිමි. | ගිවිසුමේ පරිදි ප්‍රමාද ගාස්තු අයකළ යුතුය. |

**3.4 ප්‍රසම්පාදනයන්**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------------- | ------------------------------ | -------------- |
| (අ) | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් e – signature ක්‍රමවේදය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින රු.2,430,000 ක් වැයකර ටැබ් යන්ත්‍ර 18 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| | i. ඇණවුම් කරන ලද වර්ගයේ ටැබ් යන්ත්‍ර සැපයීමට තෝරාගත් සැපයුම්කරුට නොහැකි වීම මත, සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ වෙනත් වර්ගයක ටැබ් යන්ත්‍ර 18 ක් මිලට ගෙන තිබුණු අතර, එසේ වෙනත් පිරිවිතරයන්ගෙන් යුතු භාණ්ඩයක් මිලට ගැනීමේදී නැවතත් මිල ගණන් කැඳවීමක් සිදු නොකර සැපයුම්කරු ඉදිරිපත් කළ මිල අනුව භාණ්ඩ මිලදී ගෙන තිබුණි. | අදාළ කාල සීමාව තුළ වෙළඳපොළෙහි පරිගණක හා තාක්ෂණික උපාංග සම්බන්ධයෙන් පැවති හිඟතාවය හා නැවත මිල ගණන් කැඳවීමට කාලය ප්‍රමාණවත් නොවීම මත පිරිවිතර හා මිල යෝග්‍ය හා සාධාරණ වූ බැවින් මිලදී ගැනීම සිදුකරන ලදි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 156 (7) රෙගුලාසිය ප්‍රකාරව, තමන්ට කටයුතු කිරීමට බලය දෙනු ලැබ ඇති සියළුම මූල්‍ය ගනුදෙනුවල නිසි පිරිමැසුම්භාවයෙන් කටයුතු කළ යුතු වුවත්, රු. 2,430,000 ක් වැය කර ටැබ් යන්ත්‍ර මිලට ගැනීමේදී, එසේ කටයුතු කර නොතිබුණු අතර, එකක් රු.135,000 බැගින් මිලට ගෙන තිබුණු ටැබ් යන්ත්‍රයේ ධාරිතාවන් සහිත ටැබ් යන්ත්‍රයක් සඳහා රු. 86,990 ක අවම මිලක් ඉදිරිපත් කර තිබුණු ආයතනයෙන් මිලදී ගැනීම සිදු කළේනම් පිරිවැය රු.864,180 කින් අඩුකර ගත හැකිව තිබුණ බව නිරීක්ෂණය විය. | සේවාවන් සැපයීමේ කාර්යයන් වඩාත් හොඳින් හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා මෙම ටැබ් යන්ත්‍ර මු.රෙ.156(7) රෙගුලාසි ප්‍රකාරව මිලදී ගෙන ඇත. | මූල්‍ය ගනුදෙනුවල නිසි පිරිමැසුම්භාවයෙන් කටයුතු කළ යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2021 දෙසැම්බර් මස අවස්ථා 03 කදී එකතුව රු.1,094,322 ක ටයර් මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 හා 5.6.2 වගන්ති අනුව වාහන සඳහා අවශ්‍ය ටයර් හා ටයර් වල ප්‍රමාණය නිශ්චිතව දක්වා පිරිවිතර සකස් කර නොතිබුණි. මිල ගණන් කැඳවා තිබුණු ප්‍රමාණයක ටයර් නිර්දේශ කළ නොහැකි බවත් ඒ අනුව කැබ් රථ සඳහා සුදුසු ප්‍රමාණයේ ටයර් සඳහා නැවත මිල ගණන් ලබා ගැනීම සුදුසු බවත් තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණද, එකී නිර්දේශයට අනුව කටයුතු කර නොතිබුණි. පසුව ප්‍රාදේශිය ලේකම්වරු තිදෙනකු විසින් ඉදිරිපත් කර තිබුණු ඉල්ලීම් පදනම්ව තාක්ෂණික ඇගයීම් කමිටුව නුසුදුසු බවට නිර්දේශ කර තිබුණු ප්‍රමාණයේ ටයර් මිලදී ගැනීම සුදුසු බවට තාක්ෂණිත ඇගයීම් කමිටුව නැවත ලබා දී තිබුණු නිර්දේශය අනුව එකතුව රු.431,568 ක් වූ ටයර් 12 ක් මිලට ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳවද සලකා බැලීමේදී ඔවුන්ගේ සේවා ඉටු කිරීමේ පහසුව හා පෙර භාවිතයන් පිළිබඳවද සලකා බලා ටයර් සඳහා මිල කැඳවන ලදී. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, වාහන සඳහා යෙදිය යුතු ටයර් වල සම්මත ප්‍රමාණයන් අනුව හා තාක්ෂණික ඇගයීම් කමිටුවෙහි නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වී හා ධාන්‍ය, ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව ගොවි සංවිධාන | පොදු අයිතිය මත භාවිතය පිළිබඳ ගැටළුව නිසාත් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත තීරණ ගැනීම සඳහා බලතල පවතින බැවින් හා කමිටු වාර්තා | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන අනුව සැළැසුම්ගත ආකාරයට වැඩසටහන |

| | | | |
|---|---|---|---|
| | වෙත ලබා දීමට මිලදී ගෙන තිබුණු වල් නෙලන යන්ත්‍ර, “තනි අයිතිය මත සියයට 50 දායකත්වය දැරීමට ඉදිරිපත් වන පුද්ගලයින් වෙත ලබා දීමට” 2022 ජනවාරි 27 දිනැති දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව මගින් තීරණය කර තිබීමෙන් ප්‍රතිලාභීන් වැඩි ප්‍රමාණයකට ප්‍රයෝජන ලබා ගැනීමට අපේක්ෂිතව තිබූ ව්‍යාපෘති යෝජනාවේ අරමුණු ඉටුවී නොමැති බවත් නිරීක්ෂණය විය. | කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයට යොමු කරන බැවින් එම තීරණය ගෙන ඇත. | ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලෝක ආහාර වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 60 දෙනෙකුට කිකිළි පැටවුන් බෙදාදීම සඳහා රු.1,338,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, 2021 අප්‍රේල් 30 දින කිකිළි පැටවුන් 2,220 ක් මිලට ගෙන සැපයුම්කරු වෙත රු.865,800 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| | i. කිකිළි පැටවුන් මිලදී ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කළ 05 දෙනෙකුගෙන් දෙදෙනෙකු කිකිළි පැටවුන් සැපයීමේ නිරත නොවන බවත්, අනෙකුත් මිල කැඳවුම්කරුවන් දෙදෙනා එම වර්ගයේ කිකිළි පැටවුන් නොසපයන බවත් නිරීක්ෂණය වූ අතර, ඒ අනුව 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) වගන්තිය අනුව, සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගි වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබා දීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සහතික විය යුතු වුවත්, යථෝක්ත ප්‍රසම්පාදන කටයුත්තේදී එකී අරමුණට අනුකූල වන ලෙස කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මෙවැනි අතපසු වීම් සිදු විමට කටයුතු නොකරන බවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) වගන්තිය අනුව සුදුසුකම් ලත් සැපයුම්කරුවන් තෝරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවද, දන්වා සිටිමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | ii. තෝරාගත් සැපයුම්කරු හැර මිල කැඳවුම් කරුවන් 4 දෙනාගේ මිල ගණන් එවීමේ ලිපි එකම තැපැල් කාර්යාලයක අනුයාත ලියාපදිංචි අංක 4 කින් එවා ඇති බවත්, පිරිවිතර තහවුරු කිරීම් වලට අදාළ තොරතුරු කිසිවක් ඇමුණුම් කර නොමැති බවත්, | ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඊ) අනුවම ඇගයීමේ හා තේරීමේ කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලංසු ඉදිරිපත් කර දෙදෙනෙකු නමින් සදොස් ලංසු ඉදිරිපත් කර ඇති බවත්, නිරීක්ෂණය විය. ලංසු ඉදිරිපත් කිරීම අසාමාන්‍ය බව ප්‍රසම්පාදන කමිටුවටද නිරීක්ෂණය වී තිබුණු අතර, එලෙස දැනුවත්භාවයකින් සිටියදීම මෙම මිල ගණන් මත පදනම්ව ප්‍රසම්පාදන තීරණය ගැනීමෙන්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඊ) යටතේ දැක්වෙන ඇගයීමේ හා තේරීමේ කාර්යයපටිපාටියේ විනිවිදභාවය හා නිත්‍යභාවය සහතිකවීමේ අරමුණ කඩකර ඇති බව නිරීක්ෂණය විය. | | |
| iii. | කිකිළි පැටවුන් මිලදී ගැනීමට ප්‍රථමව, සැපයුම්කරු විසින් සපයන කිකිළි පැටවුන්, මිල ගණන් කැඳවීමේදී පිරිවිතරවල සඳහන් වර්ගයේ කිකිළි පැටවුන් බව පරීක්ෂා කර තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, මිලදී ගෙන තිබුණු කිකිළි පැටවුන් 2021 අප්‍රේල් මාසයේදී ප්‍රතිලාභීන් 60 දෙනෙකු වෙත බෙදා දී තිබුණි. 2021 ඔක්තෝබර් මාස වන විට බෙදා දී තිබුණු කිකිළි පැටවුන් 2,220 න් 1,067 ක් මිය ගොස් ඇති බව පසුවිපරම් වාර්තා අනුව නිරීක්ෂණය විය. | සැපයුම්කරු විසින් කිකිළි පැටවකු වෙනුවෙන් අවම මිලක් ලබා දීම හා නිසි පරිදි එන්නත් කර ඇති බවට ලබා දුන් සහතික මත පදනම් වී මෙම කිකිළි පැටවුන් මිලදී ගැනීම තීරණය කරන ලදී. ප්‍රවාහනය කිරීමට පෙර පරීක්ෂා කිරීම ප්‍රායෝගිකව දුෂ්කර බැවින් ප්‍රවාහනය කිරීමට පෙර පරීක්ෂා කිරීම සිදු නොවුණි. එම කාල සීමාව තුල රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කිකිළි පැටවුන් මිය යාම පිළිබඳ පරීක්ෂා කිරීම් සීමා වී ඇත. | යෙදවූ මුදල් වලින් ඵලදායිව ප්‍රයෝජන ගත යුතු අතර, අපේක්ෂිත අරමුණු කරා ළගා විය යුතුය. |
| iv. | මෙම ව්‍යාපෘතිය සඳහා වාණිජ මට්ටමේ කුකුළු ෆාම් ඇති කිරීමට ප්‍රතිපාදන ලබාදෙන බව දක්වා තිබුණු නමුත්, ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයට මිල ගණන් කැඳවා නොමැති බවත්, ප්‍රතිලාභීන්ට ලබා දී ඇත්තේ මස් හා බිත්තර යන ආකාර දෙකම සඳහා භාවිතා කරන කුකුළන් සමඟ දෙමුහුම් වූ විශේෂයක් හා තවත් වාණිජමය වශයෙන් බිත්තර දමන වර්ගයේ නොවන විශේෂ කිහිපයක් බවත් නිරීක්ෂණය විය. ඒ අනුව රු.1,338,000 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභීන්ට උපරිම ආර්ථික | මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ලබා දී ඇති උපදෙස් පරිදි හා අධාර මුදල් ලෝක ආහාර වැඩසටහනේ අරමුණු ඉටුවන අකාරයට ගිරිරාජ් ෆේකස් හෙක් ක්රොස් වර්ගයේ පැටවුන් ලබා දීමට කටයුතු කර ඇති බව දන්වමි. | ව්‍යාපෘති අනුමත කර ඇති ආකාරයට ක්‍රියාත්මක කළ යුතු අතර යෙදවූ මුදල් වලින් ඵලදායිව ප්‍රයෝජන ගෙන අපේක්ෂිත අරමුණු කරා ළගා විය යුතුය. |

වාසි ලබා ගැනීමට හැකිවන පරිදි නියමිත පිරිවිතර සහිත කිකිළි පැටවු මිලට ගැනීමට නොහැකි වී ඇති අතර එම නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට නොහැකි වී ඇති බවත් නිරීක්ෂණය විය.

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ධාවන තත්ත්වයේ නොපවතින හා අලුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායි නොවන වාහන 5 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම වාහන 05 වෙන්දේසි කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවති. | කඩිනමින් වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සියඹලාණ්ඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් වාහන 04 ක් වර්ෂ 04 - 16 ත් අතර පරාසයකද, බිබිල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් වාහන 03 ක් වර්ෂ 06 - 18 ත් අතර පරාසයකද, මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් වාහන 03 ක් වර්ෂ 01 - 15 ත් අතර පරාසයකද, වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් වාහනයක් 2015 වර්ෂයේ සිටද, තණමල්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් ජල බවුසරයක් 2018 වර්ෂයේ සිටද අක්‍රීය තත්ත්වයෙන් කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව තිබුණු අතර ඒවා අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණයට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවති. | අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ්රථයක් 2016 දෙසැම්බර් 17 දින අනතුරකට ලක්ව රු.2,630,726 ක අලාභයක් සිදුව තිබුණි. එම අලාභයෙන් රු.2,265,342 ක් 2017 ඔක්තෝම්බර් 17 දින ප්‍රතිපූර්ණය වී තිබුණු අතර අළුත්වැඩියා ආයතනය විසින් ලබා දී තිබුණු රු.176,860 ක් වට්ටම් හැර, රජයේ වියදමින් රු.188,524 ක් වැය කර තිබුණද, එම අලාභය මුදල් රෙගුලාසි 109 යටතේ පොත් වලින් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | අනතුරට අදාළ රු.188,524 ක මුදල වාහන අළුත් වැඩියා වැය විෂය මඟින් දරා ඇත. | මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව අලාභය කපාහැරීම කඩිනමින් සිදුකළ යුතුය. |
| (ආ) | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයකට 2002 සැප්තැම්බර් 19 දින සිදු වූ අනතුරින් රු.375,000 ක අලාභයක් සිදුව තිබුණි. මුදල් රෙගුලාසි 104 (4) වාර්තාව අනුව එම අලාභය රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණු අතර, එම අලාභය අයකරගන්නා ලෙස 2013 අප්‍රේල් 23 දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වන විට එම අලාභයෙන් රු.110,000 ක් පමණක් අයකරගෙන තිබුණි. | මෙම අනතුර සම්බන්ධයෙන් වගකිවයුතු රියදුරුගෙන් අදාල අලාභය වන රු.375,000 ක මුදලින් රු.122,500 ක් මේ වන විට අයකරගෙන ඇති අතර මසකට රු.2,500 ක් බැගින් අයකිරීම් සිදුකරනු ඇත. | අලාභය අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේදී තණමල්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් "සපිරිගමක්" ජනතා සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.8,291,665 ක වියදමක් දරා ගුැවල් ඇතිරීම හා මෝටර් ග්‍රේඩර් කිරීම මගින් සංවර්ධනය කරන ලද ග්‍රාමීය මාර්ග 11 ක් 2021 වර්ෂයේදී කාපට් අතුරා සංවර්ධනය කර තිබුණි. දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් මාර්ග පිළිබඳව හා එක් එක් වර්ෂය තුළ සංවර්ධනය කරන ලද මාර්ග පිළිබඳ වාර්තා නඩත්තු කර තිබුණේ නම් වර්ෂයකට අඩු කාලයක් තුළ එකී මාර්ග 11 සංවර්ධන කර ඇති බව කමිටුවලට දැනුම් දී වෙනත් ප්‍රමුඛතාවය ඇති මාර්ග සංවර්ධනය කිරීමට ඉඩ තිබුණි. ප්‍රාදේශිය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල නිර්දේශ මත සංවර්ධන කටයුතු සිදු කරනු ලබන රාජ්‍ය ආයතන ඒකාබද්ධව සැලසුම්සහගතව කටයුතු නොකිරීම නිසා රජයේ මුදල් ආර්ථික වශයෙන් පිරිමැසුම්දායක ලෙස යෙදවීමක් සිදු වී නොමැති බවත් නිරීක්ෂණය විය. | මෙම මාර්ග කාපට් අතුරා සංවර්ධනය කිරීමට යෝජිත බව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අප දැනුවත් කර නොමැති අතර, ග්‍රාමීය කමිටු යෝජනා වල ප්‍රමුඛතා ගත කිරීම අනුව අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. | රජයේ අරමුදල් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුය. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.6 උප වගන්තිය අනුව, නිලධාරියකුගේ වැටුපෙන් අයකරන නිවාස කුලිය එහි සාධාරණ ආර්ථික කුලියට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වන්නේ නම් නිලධාරියාගේ වැටුපෙන් සියයට ගණනක් අයකිරීම වෙනුවට,<br><br>නිශ්චිත නිවාස කුලියක් ලේකම්වරයාගේ අවසරය මත අය කළ හැකි වුවත්, ඊට අනුකූල නොවන ලෙස 2015 හා 2010 වර්ෂවල තක්සේරු කිරීම් අනුව නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයකළ යුතු රු.70,892 ක් වූ තක්සේරු කුලී අඩුවෙන් අයකර තිබුණි. | 2018 දෙසැම්බර් මස තිබූ වැටුප අනුව අයකර ඇති අතර වැටුප් වැඩිවීමේදී හා වැටුප් වර්ධක ලබා දීමේදී එම වැටුපට අනුව නිල නිවාස කුලිය අය කර නොමැත. අය කිරීම් සඳහා නිලධාරීන් දැනුවත් කර ඇත. | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා | හිඟ නිවාස කුලිය අය කර ගත | හිඟ කුලී කඩිනමින් |

| | | | |
|---|---|---|---|
| | කාලයට අදාළව නිවාස කුලී අඩුවෙන් අය කිරීම හේතුවෙන් නිලධාරීන් 51 දෙනෙකුට අදාළව රු.1,265,692 ක් වූ නිවාස කුලී 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් හිඟව පැවතුණි. | යුතු විශ්‍රාම ගිය නිලධාරින්ගේ හිඟ මුදල වාරික වශයෙන් හෝ එකවර ගෙවන ලෙස දැනුම් දී ඇති අතර, දැනට සේවයේ නියුක්ත නිලධාරින්ගේ වැටුපෙන් අයකර එවන ලෙස ආයතන ප්‍රධානින් දැනුවත් කර ඇත. | අයකර ගත යුතුය. |
| (ඇ) | 2008 ජූනි 26 දිනැති අංක 13/ 2008 චක්‍රලේඛයේ 04 වගන්තිය අනුව අතිරේක ඉන්ධන ප්‍රතිපාදන ලබා ගන්නේ නම් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ අනුමැතිය ලබා නොගෙන වෙන්කල වාහන 03 ක් සඳහා රජයේ ඇණවුම් මත ඉන්ධන ලීටර් 3924.3ක් ද,<br>බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ඉන්ධන ලීටර් 1281.317 සඳහා රු.139,500 ක්ද වැයකර තිබුණි. | ව්‍යාපෘති පරීක්ෂා කිරීම සඳහා අමතර ඉන්ධන ලබා ගෙන ඇත. ඒ සඳහා වෙන් කර ඇති පරිපාලන වියදම් මඟින් අමතර ඉන්ධන වියදම් පියවා ඇති අතර, මෙම ඉන්ධන යොදාගෙන ඇත්තේ එම ව්‍යාපෘති කාර්යයන් අධීක්ෂණය සඳහාම වන අතර, දිස්ත්‍රික්කයෙන් පිටත රාජකාරී සඳහා ලබාගත් ඉන්ධන වලට අදාළ බිල්පත් ප්‍රතිපූර්ණය කර ඇත. | අතිරේක ඉන්ධන ප්‍රතිපාදන සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඈ) | මැදගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමේදී විශ්‍රාමිකයින් 04 දෙනෙකු සඳහා රු.490,061 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණු අතර, එම මුදලින් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.337,061 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | මෙම මුදලින් රු.190,000 ක් අයකරගෙන ඇති බවත්, ඉතිරි මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | වැඩිපුර ගෙවීම් අප්‍රමාදව අයකරගත යුතුය. |
| (ඉ) | තණමල්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2010 සිට 2016 වර්ෂය දක්වා කාලය තුල බෙදාදීමට සකස් කරන ලද (අවසරපත්‍ර) බලපත්‍ර 37 ක් ප්‍රතිලාභීන් වෙත බෙදාදීමට කටයුතු නොකර 2021 දෙසැම්බර් 15 දින වන විටත් කාර්යාලයේ රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | එම බලපත්‍ර බෙදා දීමට අදාළ කටයුතු මේ වන විට සිදු කරමින් පවති. | අවසරපත්‍ර කඩිනමින් බෙදාදීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරනු ලැබූ 2019 හා 2020 වර්ෂවල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද දීමනාපත්‍ර 13 ක් සහ 2021 ඔක්තෝබර් 06 දින ලියාපදිංචි කරන ලද දීමනාපත්‍ර 29 ක් දීමනා පත්‍ර හිමියන්ට බෙදාදීමට කටයුතු නොකර 2021 දෙසැම්බර් 15 දින වන විටත් තණමල්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ රඳවාගෙන ඇති බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී අවසර පත්‍ර හා දීමනා පත්‍ර බෙදා දීමට කටයුතු කරමි. | දීමනාපත්‍ර කඩිනමින් බෙදාදීමට කටයුතු කළ යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වුවද, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. සියලුම කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ නිලධාරීන් අවම වශයෙන් සේවයට පැමිණීම ආදී කරුණු හේතුවෙන් කාර්යය සාධන ගිවිසුම් අත්සන් කිරීම සිදු නොවුවද, 2022 වර්ෂය සිට නිසි පරිදි සිදුකර ගෙන යන බව දන්වමි. | චක්‍රලේඛය අනුව කාර්යසාධන ගිවිසුම් වලට එළඹිය යුතුය. |
| (ආ) | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක අනුමත සේවක සංඛ්‍යාවෙන් මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 13 ක්, තෘතීයික ශ්‍රේණියේ තනතුරු 21 ක්, ද්විතීයික ශ්‍රේණියේ තනතුරු 117 ක් හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 11 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි. තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක ද්විතීයික ශ්‍රේණියේ සේවකයින් 55 ක අතිරික්තයක් විය. | සියළුම තනතුරු වල පවතින පුරප්පාඩු සම්බන්ධව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත වාර්තා කර ඇත. තනතුරු අතිරික්තව පැවතීමට හේතුව සංවර්ධන නිලධාරි නව පත්වීම් ලැබීම බව දන්වා ඇත. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. අතිරික්තතා විධිමත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව උපරිම කාලසීමාව අවුරුදු 05 ක් එකම තනතුරේ/සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරුවීම් ලබාදිය යුතු වුවද, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 30 දෙනෙකු සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 හි සේවයේ නියුතු නිලධාරීන් 575 දෙනෙකු 2021 දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂ 06 සිට වර්ෂ 30 ක් දක්වා කාලයක් එකම සේවා ස්ථානයේ සේවයේ යෙදී සිටින බවද, නිරීක්ෂණය විය. | සෑම වර්ෂයකදීම වාර්ෂික ස්ථානමාරු කැඳවන අවස්ථාවේදී, සියළුම නිලධාරීන් දැනුවත් කර ස්ථානමාරු ඉල්ලීම සඳහා අවස්ථාව ලබා දී ඇති බවත්, අමාත්‍යාංශයේ වෙනම තොරතුරු පද්ධතියක් යාවත්කාලීන කරමින් මාර්ගගත ක්‍රමයට ස්ථානමාරු කිරීම් සිදු කරනු ලබන බවත්, එසේ නිලධාරීන් වාර්ෂික ස්ථානමාරු අයදුම් කළද, බොහෝ නිලධාරීන් හට ස්ථානමාරු ලැබී නැති බවත්, දන්වා ඇත. | චක්‍රලේඛය අනුව ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුය. |